[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

14 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

| | | |
|---|---|---|
| කතෝලික ධර්මය | I, II | පැය තුනයි |
| கத்தோலிக்கத் திருமறை | I, II | மூன்று மணித்தியாலம் |
| Catholicism | I, II | Three hours |

## කතෝලික ධර්මය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර** තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** දේව වචනය පරම්පරාවෙන් පරම්පරාවට දායාද කරන ලද සම්ප්‍රදාය කුමක් ද?
(1) ලිඛිත (2) පූජක (3) වාචික (4) යාවේ

**2.** නව ගිවිසුමේ සංකේත භාවිතයෙන් ලියා ඇති ග්‍රන්ථය කුමක් ද?
(1) එළිදරව්ව (2) සංදේශ (3) සලමොන්ගේ ප්‍රඥාව (4) ශුභාරංචිය

**3.** එළිදරව් සාහිත්‍යයෙහි එන සුදු වර්ණයෙන් අර්ථවත් කරනුයේ,
(1) සාගතයයි. (2) මරණයයි. (3) යුද්ධයයි. (4) ජයග්‍රහණයයි.

**4.** "හොඳ නරක දැනගන්න පුළුවන් වන ලෙස ඥානවන්ත සිතක් ඔබේ දාසයාට දුන මැනව." මෙසේ දෙවියන් වහන්සේට යාච්ඤා කළේ,
(1) දාවිත් රජතුමා ය. (2) සලමොන් රජතුමා ය. (3) පාරාවෝ රජතුමා ය. (4) හෙරෝද් රජතුමා ය.

**5.** ජේසුස් වහන්සේගේ කර පිට තැබූ කුරුසිය උසුලාගෙන යාමට සහය වූයේ,
(1) සිරේනියේ සීමොන් ය. (2) සයිමොන් පේදුරු ය.
(3) රෝම සොල්දාදුවෙක් ය. (4) නිකදේමුස් ය.

**6.** 1543 දී මෙරටට පැමිණි පළමු ධර්මදූත කණ්ඩායම හඳුන්වන්නේ කුමන නමින් ද?
(1) ෆ්‍රැන්සිස්කාන (2) දොමිනිකාන (3) අගුස්තීනු (4) ජේසු නිකායික

**7.** පහත සඳහන් සිදුවීම් කෙරෙහි අවධානය යොමු කරන්න.
A - කතෝලික පියවරුන් රටින් පිටුවහල් කිරීම
B - දහම් පාසල් ආරම්භ කිරීම
C - කතෝලික දහම ඇදහීම තහනම් කිරීම
D - කතෝලික දෙව්සත්හල් ආරම්භ කිරීම
E - දිව්‍ය පූජාව පැවැත්වීම තහනම් කිරීම

ඉහත සඳහන් සිදුවීම් අතුරින් ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශ පාලනය කරන සමයේ ක්‍රියාවට නංවන ලද ඇ දැක්වෙන වරණය කුමක් ද?
(1) A, B හා C (2) A, C හා E (3) B, C හා E (4) C, D හා E

**8.** ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා විසින් ලියන ලද ග්‍රන්ථයක් වන්නේ,
(1) යාච්ඤා නිධානයයි. (2) කතෝලික සහා ධර්මෝපදේශයයි.
(3) ප්‍රඥා සාහිත්‍යයයි. (4) දේව වේද පුරාණයයි.

**9.** සුභාරංචි කතුවරුන් හතර දෙනා ම වාර්තා කරන එකම ප්‍රාතිහාර්යය වන්නේ,
(1) අතක් පණ නැති මිනිසා සුව කිරීම ය. (2) ලාසරස් මළවුන්ගෙන් නැගිටවීම ය.
(3) පූප වැඩි කිරීම ය. (4) කොර මිනිසා සුව කිරීම ය.

[දෙවැනි පිටුව බලන්න

**10.** ජේසුස් වහන්සේ ගෝලයින්ගේ පාද සේදීමේ සිද්ධිය ගෙනහැර දක්වන එකම සුවිශේෂක කතුවරයා වන්නේ,
(1) ශුද්ධ වූ ලූක්තුමා ය. (2) ශුද්ධ වූ ජොහන්තුමා ය. (3) ශුද්ධ වූ මතෙව්තුමා ය. (4) ශුද්ධ වූ මාක්තුමා ය.

**11.** දයාවේ සොයුරියෝ නිකාය ආරම්භ කළේ,
(1) II වන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා ය. (2) ශුද්ධ වූ තෙරේසා මව්තුමිය ය.
(3) ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා ය. (4) ශුද්ධ වූ මරිය ගොරෙත්ති මුනිවරිය ය.

**12.** සත්‍යයට සාක්ෂි දැරීම නිසා ශුද්ධවරයට ඔසවනු ලැබුවේ,
(1) අසීසියේ ශුද්ධ වූ ෆ්‍රැන්සිස් මුනිතුමා ය. (2) ශුද්ධ වූ මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමා ය.
(3) ශුද්ධ වූ සෙබස්තියන් මුනිතුමා ය. (4) පාදුවා හි ශුද්ධ වූ අන්තෝනි මුනිතුමා ය.

**13.** නික්මයාම 20 : 3 - 6 අනුව "මා හැර අන් කිසිම දෙවි කෙනෙකු නුඹට නොසිටිය යුතු ය" යනුවෙන් පෙන්වා දෙන්නේ,
(1) පළමු දේව පනත ය. (2) තුන්වන දේව පනත ය.
(3) හතරවන දේව පනත ය. (4) දහවන දේව පනත ය.

**14.** පෞද්ගලික දේපළ පරිහරණය කළ යුතු ආකාරය පිළිබඳව දෙවි සමිඳාණන් වහන්සේ අපට නියෝග කරන දේව පනත් දෙක නම්
(1) 1 සහ 3 ය. (2) 2 සහ 3 ය. (3) 6 සහ 9 ය. (4) 7 සහ 10 ය.

**15.** චතාරික සමය ආරම්භ වන්නේ,
(1) ගොබ් ඉරිදා ය. (2) මහ බ්‍රහස්පතින්දා ය. (3) අළු බදාදා ය. (4) මහ සිකුරාදා ය.

**16.** ජනවන්දනා වර්ෂයේ කොළ වර්ණය භාවිත කරනුයේ,
(1) චතාරික සමයේ ය. (2) සාමාන්‍ය සමයේ ය. (3) නත්තල් සමයේ ය. (4) පාස්කු සමයේ ය.

**17.** දිව්‍ය පූජාවේ භාවිත වන යැදුම් කිහිපයක් පහත දැක්වේ.
A - ස්තෝත්‍ර යාගික යැදුම
B - පොදු යැදුම
C - විශ්වාසකයින්ගේ යැදුම
D - පඬුරු මත යැදුම
E - බොදුනෙන් පසු යැදුම
ඉහත යැදුම් අතුරින් මුලසුනේ යැදුම් තුන ඇතුළත් වරණය කුමක් ද?
(1) A, B හා C (2) A, C හා E (3) B, D හා E (4) C, D හා E

**18.** උත්තම පූජක යාච්ඤාව පුරා දිවයන එක් ප්‍රධාන තේමාවක් වන්නේ,
(1) සාමයයි. (2) බැහැපත්කමයි. (3) එකමුතුකමයි. (4) නිහතමානිකමයි.

**19.** ජේසුස් වහන්සේ තමන් වහන්සේව ම කඩා දුන් බව සංකේතවත් කරන්නේ,
(1) පූප කැඩීමෙනි. (2) සාමය පැතීමෙනි.
(3) ස්තෝත්‍ර යැදුමෙනි. (4) ස්වාමිවාක් ආරාධනාවෙනි.

**20.** ජේසුස් වහන්සේ උත්තම පූජක යාච්ඤාවෙන් පසු පැමිණියේ,
(1) ඔලිව් කන්දට ය. (2) කපාල කන්දට ය.
(3) තාබෝර් කන්දට ය. (4) ගෙත්සෙමන උයනට ය.

**21.** දෙවියන් පිළිබඳ පරම්පරාගත විශ්වාස හා අත්දැකීම් පදනම් කර ගෙන ශුද්ධ බයිබලයේ ලියැවී ඇති පොත් කාණ්ඩය වනුයේ,
(1) පංච පුස්තක ය. (2) දිවැසි පොත් ය. (3) ප්‍රඥා පොත් ය. (4) ඉතිහාස පොත් ය.

**22.** දෙවියන් වහන්සේගේ පණිවුඩ ප්‍රකාශ කරන අය හඳුන්වනු ලබන්නේ,
(1) පරිසිවරු නමිනි. (2) සද්දුසිවරු නමිනි. (3) දිවැසිවරු නමිනි. (4) පූජකවරු නමිනි.

**23.** දේව රාජ්‍යයේ සුභාරංචිය ලෙසින් හඳුන්වනු ලබන්නේ,
(1) ශුද්ධ වූ මාක් සුභාරංචියයි. (2) ශුද්ධ වූ ලූක් සුභාරංචියයි.
(3) ශුද්ධ වූ මතෙව් සුභාරංචියයි. (4) ශුද්ධ වූ ජොහන් සුභාරංචියයි.

**24.** ප්‍රාග් ඉතිහාසය ලෙස හැඳින්වෙන්නේ උත්පත්ති පොතේ කවර පරිච්ඡේද ද?
(1) උත්පත්ති 1-10 (2) උත්පත්ති 1-11 (3) උත්පත්ති 1-12 (4) උත්පත්ති 12-50

**25.** නව මැවිල්ලේ ආරම්භකයා ලෙස කැඳවීම ලැබීමට හේතු වූ ප්‍රධාන කරුණු කිහිපයක් පහත දැක්වේ.
- ඔහු සත්ගුණවත් මිනිසෙකි.
- ඔහුගේ පරම්පරාවෙන් නිදොස් මිනිසකු විය.
- ඔහු දෙවියන් වහන්සේ සමඟ සුහදතාවයෙන් හැසුරුණේ ය.

මෙම කරුණුවලින් කියැවෙන පුද්ගලයා වන්නේ,
(1) මෝසෙස් ය. (2) ඊසාක් ය. (3) ආබ්‍රහම් ය. (4) නෝවා ය.

/තුන්වැනි පිටුව බලන්න

**26.** ඊශ්‍රායෙල් ජනතාවගේ වර්ධනය මර්දනය කිරීමට මිසරයේ රජතුමා පියවර තුනක් ගත් කාලයේ මෙලොව උපත ලැබුයේ,
(1) ආබ්‍රහම් ය. (2) ජාකොබ් ය. (3) මෝසෙස් ය. (4) ජෝශප් ය.

**27.** දෙවියන් වහන්සේ ආබ්‍රහම්තුමා සමඟ ඇති කර ගත් ගිවිසුම ඉදිරිපත් කර ඇති සම්ප්‍රදායන් දෙක වන්නේ,
(1) D හා P ය. (2) J හා D ය. (3) J හා E ය. (4) J හා P ය.

**28.** ජේසුස් වහන්සේ පාළුකරයේ දී පරීක්ෂා කරනු ලැබූ දින ගණන,
(1) 30 කි. (2) 40 කි. (3) 50 කි. (4) 60 කි.

**29.** ශ්‍රාවකයන් හැත්තෑ දෙදෙනා ධර්මදූත සේවයට පිටත්කර යැවීමේ දී පසුම්බියක් හෝ මල්ලක් හෝ පාවහන් හෝ රැගෙන නොයන ලෙසට අවවාද කිරීමෙන් පෙන්නුම් කරන්නේ,
(1) දේව සංරක්ෂණයයි. (2) දේව ප්‍රේමයයි. (3) දේව මහිමයයි. (4) දේව කරුණාවයි.

**30.** ආත්මික මව්පියකු වීමට එම දෙදෙනාට ම තිබිය යුතු සුදුසුකමක් වන්නේ කුමක් ද?
(1) අවුරුදු 20 ඉක්මවා ගිය අය වීම (2) විවාහක අය වීම
(3) මිල මුදල් ගැවසීම (4) ආරම්භක ප්‍රසාද නිධාන ලබා තිබීම

**31.** සමඟි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය වෙත පිය නැඟීමට අපේක්ෂා කරන්නා අනුගමනය කළ යුතු පියවර පහත දැක්වේ.
A - ආත්ම සෝදිසියක යෙදීම
B - නැවත පව් නොකිරීමට සිතා ගැනීම
C - කළ පව් උච්චාරණය කිරීම
D - කළ පව්වලට මනස්ථාපනය වීම
E - දෙන දඬුවම් හා පශ්චාත්තාප ක්‍රියා ඉටු කිරීම
එම පියවර නිවැරදි අනුපිළිවෙළින් දක්වා ඇති වරණය කුමක් ද?
(1) A, B, C, D, E (2) A, D, B, C, E (3) D, C, B, A, E (4) E, D, C, B, A

**32.** සමාජ සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන දෙක වන්නේ,
(1) පූජකවරය හා ආශිර්වාදකාර බන්ධනයයි. (2) ප්‍රසාද ස්නාපනය හා පූජකවරයයි.
(3) පූජකවරය හා දිව්‍ය සත්ප්‍රසාදයයි. (4) අභිවෘද්ධි ආලේපය හා පූජකවරයයි.

**33.** ආරණ්‍යවාසී තාපසයන් අතර පළමුවැන්නා,
(1) ඊජිප්තුවේ ශුද්ධ වූ අන්තෝනි මුනිතුමා ය. (2) ශුද්ධ වූ බැසිල් මුනිතුමා ය.
(3) තීබිස්හි පාවුලුතුමා ය. (4) ශුද්ධ වූ බෙනදික් මුනිතුමා ය.

**34.** පොදු පූජකවරය තුළින් ලැබෙන දිවැසිවර කාර්යයෙහි නෝතැන්නක් වනුයේ,
(1) කතෝලික දහම් පාසල ය. (2) තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය ය.
(3) මරිය හමුදාව ය. (4) ශාන්ත වින්සන් ද පාවුලා සමිතිය ය.

**35.** පහත සඳහන් වන්නේ ආත්මික සහ ශාරීරික පුණ්‍ය ක්‍රියා කිහිපයකි.
A - පව්කරුවන් පාපයෙන් මුදවා ගැනීම
B - මළවුන් වැළලීම
C - දුකින් පෙළෙන්නන් සැනසීම
D - වහලුන් නිදහස් කිරීම
ඉහත කරුණු අතුරින් ආත්මික පුණ්‍ය ක්‍රියා වන්නේ,
(1) A හා C ය. (2) A හා D ය. (3) B හා D ය. (4) C හා D ය.

**36.** එක්වරු ශීලය රැකීමට නියම වූ දින වන්නේ,
(1) අළු බදාදා සහ ශොබ් ඉරිදා ය. (2) අළු බදාදා සහ මහ සිකුරාදා ය.
(3) මහ බ්‍රහස්පතින්දා සහ ශොබ් ඉරිදා ය. (4) වසරේ සෑම සිකුරාදා දිනවල සහ අළු බදාදා ය.

**37.** ජේසුස් වහන්සේ තම ගෝලයින්ට දෙවියන් වහන්සේ ආමන්ත්‍රණය කිරීමට ඉගැන්වූයේ කෙසේ ද?
(1) 'ස්වර්ගයේ වැඩ සිටින අපගේ පියාණනි' යනුවෙනි. (2) 'අබ්බා පියාණනි' යනුවෙනි.
(3) 'මාගේ ස්වාමීනි' යනුවෙනි. (4) 'මාගේ දෙවියනි' යනුවෙනි.

**38.** යාච්ඤාවෙන් ඉල්ලූ දෑ නොවැරදීම ලැබෙන බවට විශ්වාස කරන විශ්වාසයේ ප්‍රකාශනයක් වන්නේ කුමක් ද?
(1) අල්ලේලූයියා (2) ප්‍රශංසා වේවා (3) ශාලොම් (4) ආමෙන්

**39.** 1917 වර්ෂයේ අවස්ථා ගණනාවක දී දේව මාතාව දර්ශනය වූයේ,
(1) ඉන්දියාවේ වේලක්කන්නිහි දී ය. (2) ප්‍රංශයේ ලූර්දු නුවර දී ය.
(3) ඉතාලියේ ලන්චියානෝ නුවර දී ය. (4) පෘතුගාලයේ ෆාතිමා නුවර දී ය.

**40.** දෙවන වතිකාන මන්ත්‍රණ සභාවට පසු යාම යැදුම හැඳින්වූයේ කෙසේ ද?
(1) දිව්‍ය පූජාව (2) වෙස්පර්ස්
(3) දේවකාරිය (4) යාමයන්හි ජනවන්දනාව

* *

[හතරවැනි පිටුව බලන්න

සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

14 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

| | |
|---|---|
| කතෝලික ධර්මය | I, II |
| கத்தோலிக்கத் திருமறை | I, II |
| Catholicism | I, II |

## කතෝලික ධර්මය II

* **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) ශුද්ධ බයිබලයෙහි ප්‍රධාන කර්තෘ සහ උපකර්තෘ නම් කරන්න.
(ii) පුරාණ ගිවිසුමට අනුව යාග පැවැත්වීමේ පරමාර්ථ **දෙක** සඳහන් කරන්න.
(iii) ශුද්ධ වූ මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමා දුටු දර්ශනයේ දේව මාතාවන්ගේ දෑතෙහි තිබුණු සුදු සහ රතු ඔටුනු **දෙකෙහි** අර්ථ දක්වන්න.
(iv) පුදසුන සූදානම් කිරීමේ පිළිවෙතට අයත් අනුකොටස් **දෙක** නම් කරන්න.
(v) කතෝලික සභාව දෙවන වතිකාන මන්ත්‍රණ සභාව මගින් කිතුනු සහා සමගිය වෙනුවෙන් නිකුත් කර ඇති ප්‍රකාශන **දෙක** මොනවා ද?
(vi) එලොහිම් සම්ප්‍රදායට අයත් සිදුවීම් **දෙක** සඳහන් කරන්න.
(vii) ප්‍රසාද ස්නාපන පොරොන්දු **දෙක** ලියන්න.
(viii) මනස්ථාපනයේ ආකාර **දෙක** සඳහන් කරන්න.
(ix) ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන ආගමනයේ දී මිනිසා අවසාන විනිශ්චයට ලක්වන ප්‍රධාන මිනුම් දඬු **දෙක** මොනවා ද?
(x) යාම යැදුම කරන කණ්ඩායම් **දෙකක්** නම් කරන්න.

**2.** (i) ද්විතීය පාවුලු සංදේශ **දෙක** නම් කරන්න.
(ii) ධර්මදූත චාරිකාවල දී ශුද්ධ වූ පාවුලුතුමාට මුහුණදීමට සිදු වූ අභියෝග **තුනක්** සඳහන් කරන්න.
(iii) ශුද්ධ වූ පාවුලුතුමාගේ ජීවිතයෙන් ඔබට ලබා ගත හැකි ආදර්ශ **පහක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

**3.** (i) ප්‍රධාන දිවැසිවරුන් **දෙදෙනකු** නම් කරන්න.
(ii) දේශක දිවැසිවරුන්ගේ ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න.
(iii) වර්තමාන සමාජයේ දේව වචනයේ පණිවිඩකරුවකු ලෙස දේව වචනය අන් අය අතරට ගෙනයාමට ඔබගේ යෝජනා **පහක්** ඉදිරිපත් කරන්න.

**4.** (i) ස්නාවක ජුවාම්තුමාගේ මවගේ සහ පියාගේ නම් ලියන්න.
(ii) ස්නාවක ජුවාම්තුමා විසින් සාමාන්‍ය ජනතාවට, අයකැමියන්ට සහ භේවායන්ට දුන් අවවාද (පණිවිඩ) **එක** බැගින් වෙන වෙන ම ලියා දක්වන්න.
(iii) ස්නාවක ජුවාම්තුමාගේ පණිවිඩ වර්තමාන සමාජයට කෙතෙක් දුරට ගැළපෙන්නේ දැයි කරුණු **පහකින්** පැහැදිලි කරන්න.

**5.** (i) ජේසුස් වහන්සේ දේව රාජ්‍යයේ වටිනාකම් පිළිබඳ ඉගැන්වූ උපමා **දෙකක්** සඳහන් කරන්න.
(ii) ශුද්ධ වූ මතෙව් සුභාරංචියට අනුව භාග්‍ය **තුනක්** ලියන්න.
(iii) ප්‍රසාද ස්නාපනය තුළින් දිවැසිවරයකු ලෙස කැඳවීම ලද ඔබ, අන්‍යාගමිකයන් ඉදිරියේ දෙවියන් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දරන්නේ කෙසේ දැයි කරුණු **පහක්** ඇසුරෙන් විස්තර කරන්න.

**6.** (i) ප්‍රසාද ස්නාපනයේ දී භාවිත කරන සංකේතාත්මක ද්‍රව්‍ය **දෙකක්** නම් කරන්න.
(ii) ආරම්භක ප්‍රසාද නිධාන **තුන** සඳහන් කරන්න.
(iii) ප්‍රසාද ස්නාපනයෙන් ලැබෙන දේව වරප්‍රසාද කිතුනු සිසුවකු ලෙස ඔබ විසින් ක්‍රියාවට නැංවිය යුත්තේ කෙසේ දැයි කරුණු **පහකින්** පැහැදිලි දෙන්න.

**7.** පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** තෝරා ගෙන, කෙටි සටහන් ලියන්න.
(i) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත
(ii) ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමාගේ සේවය
(iii) රෝගීන් ආලේපනය කිරීමේ දේව ප්‍රසාද නිධානය
(iv) ශුද්ධ වූ ජපමාලය

* * *